# ජනසවිය

## පළමු වටයේ සාර්ථකත්වය තුළින් දෙ වැනි වටයට



BKT 0168
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් 1990 නොවැම්බර් 28 ද බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ජනසවිය සම්මේලනයෙහි කරන ලද විශේෂ දේශනය

ජනසවියේ දෙ වන වටය ආරම්භ කරන්නට ලෑස්ති වෙන මේ වෙලාවේ අපේ යුතුකමක් තිබෙනවා පළමු වැනි වටයෙන් ලබාගත්ත අත්දැකීම් සැලකිල්ලට ගැනීමට. අපේ පරමාර්ථය ඉෂ්ට කරගැනීමට, අපේ වැඩපිළිවෙළවල් වඩාත් ක්‍රමානුකූල කරගැනීමට ජනසවිලාභීන්ට වැඩියෙන් ප්‍රතිලාභ ලැබෙන ආකාරයට අපේ වැඩපිළිවෙළවල් සකස් කර ගැනීම අපේ යුතුකම යි.

**පරිණාමය හා පසුබිම**

මම කැමති යි ප්‍රථමයෙන් ම තමුන්නාන්සේලා ගේ අවධානය යොමුකරන්නට එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයට. ඒ මැතිවරණ ප්‍රකාශනයේ ප්‍රධාන ම ප්‍රතිඥාවක් තමයි අපේ රටේ නැති බැරි ජනතාව ඇති හැකි ජනතාවක් බවට පත් කිරීම. ඒ සඳහා තමයි "ජනසවිය" වැඩපිළිවෙළ පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කළේ. ඒ මැතිවරණයට කලින් ; ජනාධිපතිවරණයට කලින්.

අප සමාලෝචනයක් කරලා බැලුවා ඒ ඒ අවස්ථාවල දී ක්‍රියාත්මක කරපු වැඩපිළිවෙළවල් පිළිබඳ. ඒ සමාලෝචනය අප කළේ මහබැංකුවේ අධිපතිතුමා ගේ ප්‍රධානත්වයෙන්, රජයේ අංශ කීපයක ම දැනුම් තේරුම් ඇති නිලධාරි මණ්ඩලයක් මඟින්.

ඒ කමිටුව හමුවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පවා කරුණු ඉදිරිපත් කළා. අප ඉදිරිපත් කරපු ප්‍රශ්නය නම්, කොයි ආකාරයෙන් ද වඩාත් කඩිනම් වන ප්‍රතිඵලදායක වන වැඩපිළිවෙළකින් දුගී දුප්පත්කම අඩු කරන්නේ ? නැති බැරිකම් අඩු කරන්නේ ? ඒක වැදගත් ලියවිල්ලක්. දේශපාලනමය වාසි ලබාගැනීමට සීමා වුණ

වාර්තාවක් නො වෙයි. ඒ සමාලෝචනය ප්‍රයෝජනවත් වුණා අපට අපේ මැතිවරණ ප්‍රකාශනය සකස් කරන්න. ඒ අනුව තමයි අප කල්පනා කළේ අවුරුදු දෙකක් ඇතුළත මේ නැතිබැරිකම් නිසා අසරණ ව, අනාථ ව සිටින පිරිසට ඔවුන් ගේ හැකියාවන් ඉදකරගන්නට ක්‍රියාදමයක් සකස් කරන්න.

ඒ අනුව තමයි අප කිව්වේ ප්‍රතිඥවක් හැටියට දිළිඳුකම පිටුදැකීම පිණිස වාරයෙන් වාරයට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා කියලා. ඒ වෙලාවේ හැත්තෑ ලක්ෂයක් ජනතාව ආහාර මුද්දරවලින් ජීවත් වුණා. සාමාන්‍යයෙන් බැලුවා ම දහතර ලක්ෂයක් දරු පවුල්. මේ පිරිස වාරයෙන් වාරය මේ දිළිඳුබවෙන් මුදගෙන ඔවුන් තුළ තිබෙන ශක්තිත් ඔවුන් ගෙත් පොදුවේ රටේත් වැඩිදියුණුවට යොදගන්නට අප ක්‍රියාකරනවයි කියලයි ඒ ප්‍රතිඥවේ තියෙන්නේ.

### ප්‍රායෝගික සංකල්පයක් හා ක්‍රියාදමයක්

මේක බොහො ම ප්‍රායෝගික වැඩපිළිවෙළක්. එම මැතිවරණ ප්‍රකාශයේ ම තියෙනවා, මේක වාරයෙන් වාරයට ක්‍රියාත්මක කරන්නේ, ඒ සඳහා අවශ්‍ය සම්පත් ගැන සැලකිල්ලට අරගෙන යි කියලා. මේ වැඩපිළිවෙළ නිසා ම උද්ධමනය උග්‍ර වුණොත්, එහෙනම් ඒකෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල අපට ලබාගන්න බැහැ. ඒ නිසා තමයි අප කිව්වේ මේ වැඩපිළිවෙළ වාරයෙන් වාරයට ක්‍රියාත්මක කරනවයි කියලා. එය බොහො ම පැහැදිලි යි. මැතිවරණ ප්‍රකාශනයේ ඒක පැහැදිලි ව තියෙනවා. අප මේ වැඩපිළිවෙළ රට ඉදිරියේ තැබුවා. ජනතාව එය පිළිගත්තා. මැතිවරණ දෙකෙන් පසු ව එය ක්‍රියාත්මක කරන්නට ආරම්භ කළා. අප එයට යෙදූ නම තමයි ''ජනසවිය''. ඒකෙන් ම තේරෙනවා ඇති තමුන්නාන්සේලාට ජනතාව තුළ සැඟවී තිබෙන සවිය එළියට ගැනීම යි මෙහි අරමුණ.

මේ දරුපවුල් දහතර ලක්ෂයට පුද්ගලයන් හැටියට ගත්තොත් හැත්තෑ ලක්ෂයක් පිරිසට වත්පොහොසත්කම් මුදල් වශයෙන්, ඉඩකඩම් වශයෙන්, දේපළ වශයෙන් නැති වෙන්නට පුළුවන්. ඒ නිසයි ඔවුන් ආහාර මුද්දරලාභීන් හැටියට ඉන්නේ. රුපියල් හත් සියයට අඩු ආදයම් ලබන අයට ආහාර මුද්දර ලැබෙනවා. රුපියල් තුන් සීය පනහක් නැත්නම් රුපියල් හාරසියයක් මාසෙකට. එහෙත්

මේ අය තුළ ශක්තීන් තිබෙනවා. බුද්ධිය තිබෙනවා. ශ්‍රමය තිබෙනවා. හැකියාවන් තිබෙනවා. දක්ෂ උගත්කම් තිබෙනවා. මෙන්න මේවා එක අතකින් ඔවුන් ගේ ප්‍රයෝජනය සඳහා අනෙක් අතින් සමාජයේ වැඩිදියුණුව සඳහාත් යොදගැනීමේ වැඩපිළිවෙළ තමයි "ජනසවිය."

ඉතින් ඔය අතරේ ඉන්නවා ආබාධිත පුද්ගලයන්. ඇස් නොපෙනෙන, කන් නොඇසෙන, වැඩක්පලක් කරන්නට අතපය වාරු නැති ආබාධිතයනුත් ඉන්නවා. නමුත් නමුත්තාත්සේලා දන්නවා ඒ ආබාධිත පුද්ගලයන් ගේ ශක්තීන් පවා දක් ඔවුන් ගේ වැඩිදියුණුවට යොදගන්න. ඇස් නොපෙනුණත් භාෂා ශාස්ත්‍රය ඉගෙන ගන්නට ක්‍රම ඇති කරගෙන යනවා. අතපය වලංගු නැතත් ඔවුන්ට ඔවුන් සතු ව තිබෙන වෙනත් හැකියාවන් ඔවුන් ගේත්, සමාජයේත් ප්‍රයෝජනයට යොදගන්න වැඩපිළිවෙළවල් තියෙනවා.

### ඉදිරියේ තිබුණු අභියෝගය

ඉතින් එහෙම නම් ආබාධිත නොවූ දිළිඳු ජනතාව ඔවුන්ට මුදල් නැතිකම් නිසා, නැත්නම් දේපළ නැතිකම නිසා, ඔවුන් සඳහට ම ආහාර මුද්දරවලින් ජීවත් වෙන තත්ත්වයට තබාගන්නවා ද ? මෙක යි අප ඉදිරියේ තිබුණ අභියෝගය. ඒක යි අප "ජනසවිය" ක්‍රියාත්මක කිරීමට වැඩපිළිවෙළක් සකස් කළේ. මොකක්ද ඒ වැඩපිළිවෙළ ?. අප කල්පනා කළා අඩු ගානේ මාස 24ක් වත්, අවුරුදු දෙකක් වත් අවශ්‍ය වෙයි. මේ නැතිබැරි ජනතාව මේ දිළිඳු ජනතාව ආහාර මුද්දරවලින් ජීවත් වන ජනතාව කිසියම් ප්‍රායෝගික ක්‍රියාදමයකට යොමු කරන්න. ඔවුන් ගේ රුචි අරුචිකම් අනුව හැකියාවන් අනුව එක්කෝ වෙළෙඳමකට, නැත්නම් ගොවිතැනකට, නැත්නම් කර්මාන්තයකට, එහෙමත් නැත්නම් කලාශිල්පයකට ඔවුන් ගේ රුචි අරුචිකම් අනුව, යොමු කරන්න කල්පනා කළා.

ඒ අවුරුදු දෙකේදි ඔවුන් ගේ පාරිභෝජනයට අවශ්‍ය සම්පත් අප ලබාදෙන්න ඕනැ. ඒ නිසා තමයි අප නියම කළේ රු. 1458 ක් මේ ජනසවිලාභීන්ට දෙන්න පාරිභෝජනය සඳහා. මන්ද ඔවුන් ගේ සැඟවී තිබෙන ශක්තිය උද කරගෙන, ඔවුන් යම ක්ෂේත්‍රයකට යොමු කොට, ඔවුන්ට එහි නියැලෙන්නට ශාරීරික ශක්තියක් තියෙන්නට ඕනැ.

පෝෂණයක් තියෙන්නට ඕනෑ. එ වැනි පෝෂණයක් නැති ව මානසික වශයෙන් මෙන් ම ශාරීරික වශයෙන් ඔවුන්ට පුළුවන්කමක් නෑ ඔවුන් ගේ අවධානය මොන ම ක්ෂේත්‍රයකට වත් යොමු කරන්න. එතකොට රු. 1458.00 පාරිභෝජනයට දීම පළමු වැනි වටයේ ක්‍රියාත්මක වුණා. දෙ වන වටයේත් ක්‍රියාත්මක වෙනවා. එහි කිසි වෙනසක් කරලා නෑ. අපි ඒකෙදි මනාපයක් දීලා තියෙනවා ඒ ජනසවිලාභියාට තමන්ට පුළුවන් නම් එයිනුත් රු. 458 ක් තමා වෙනුවෙන් ඉතිරි කිරීමකට යොදගන්න. එහෙම කරන්නේ එයා ගේ ම ප්‍රයෝජනය පිණිස.

තවත් මුදලක් එයා වෙනුවෙන් තැන්පත් වෙනවා. රු. 1042 ක්. එතකොට තමයි රු. 2500 ක් වෙන්නේ. ඒක ඉතිරිකිරීමක්. මොකක්ද බලාපොරොත්තුව ? තව අවුරුදු දෙකක් යන විට ඒ ඉතිරිකරන මුදලෙන් අඩුගානේ රු. 25000 ක වත් සම්පතක් එයා සතු වෙනවා. මේ තඹදෙයිතුවක අයිතියක් වත් නැති ව හිටි පුද්ගලයාට, රු. 25000 ක සම්පතක් ලැබෙනවා. ඒක අප කල්පනා කළේ අර අවුරුදු දෙක ඇතුළත එයා යොමු වන ක්ෂේත්‍රයේ වැඩපිළිවෙළවල් ව්‍යාප්ත කරගන්නට ණය මුදලක් ලබාගැනීමට ඇපයකට තබන්න. ඒ මඟින් එයාට පුළුවන් වන නිසයි. නමුත් අර පාරිභෝජනයට දෙන රු. 1458 ත් එයාට පුළුවනි, කැමති නම් මනාප නම් රු. 458 වන මුදලෙනුත් තමා කැමති ප්‍රමාණයක් ඉතිරියකට දමාගන්න. එතකොට අර තමා වෙනුවෙන් එක්රැස් වෙන අරමුදල තවත් තර වනවා.

දැන් පළමු වන වටයේ දී ඒක සිදු වී තියෙනවා බලාපොරොත්තු නොවුණ අන්දමින්. ඇතැම් ප්‍රදේශවල මගේ හිතේ 100% ක් විතර මේ ජනසවිලාභීන් අර රු. 458 ම තැන්පතුවට ඉතිරි කිරීමේ තැන්පතුවට යවා තියෙනවා. ඒ විශිෂ්ට වර්තාව එන්නේ උතුරුකරයෙන්. උතුරුකරයේ ජනතාව අර තමන්ට ලැබෙන රු. 1458 න් රු. 458 ම ඉතිරියට දැම්මා. රු. 1000 කින් පාරිභෝජනය කරගත්තා. ඇතැම් ප්‍රදේශවල ඊට අඩුවෙන් කොයි එක වුණත් ඒ මනාපය පාවිච්චි කරලා තියෙනවා. ඒකෙන් මොකක් ද තේරෙන්නේ ? මේ ජනතාව සුදනම් හැම ද ම නැතිබැරි තත්ත්වයේ නො සිට ඇතිහැකි තත්ත්වයකට පත් වෙන්න. තමන්ට කියලා සම්පතක් තියාගෙන ඒ සම්පත මගින් තමන් ගේ වැඩිදියුණුවක් ඇති කරගන්න.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## එකිනෙකට සම්බන්ධ වැඩපිළිවෙලවල් සමූහයක්


පාරිභෝජනයට දෙන අර රු. 1458 තමන් ගෙ පාරිභෝජනයට උවමනාකරන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, රෙදිපිළි ආදිය ලබාගැනීමට අප යොමු කළා සමුපකාර සමිතියට. ඇයි එහෙම කළේ ? ඒ වෙලාවේ සමුපකාර ව්‍යාපාරය අඩාළ වෙනවා අප දැක්කා. අපට ඕනෑ කළා ඒ සමුපකාර ව්‍යාපාරය පණගන්වන්නට. ඒ සමුපකාර ව්‍යාපාරය පණගැන්වුවොත් මේ ජනසවිලාභීන්ට ඒ ව්‍යාපාරයේ ම කොටස්කරුවන් වෙන්නටත් ඉඩකඩ තිබෙනවා.

ඊළඟට අප යොදපු වැඩපිළිවෙළ තමි, මේ පාරිභෝජනයට ගන්න හැම ද්‍රව්‍යයක් ම දේශීය ද්‍රව්‍යයක් වීම. ඒ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය මාර්ගයෙන් පමණ යි අර පාරිභෝජනයන් සලසාගන්නට වෙන්නේ. ඒකෙන් මොකක්ද බලාපොරොත්තු වෙන්නේ ? දේශීය නිෂ්පාදනයට රුකුලක් දෙන්නට. ඇයි එහෙම කළේ ? මේ ජනසවිලාභීන් විවිධ ක්ෂේත්‍රවලට යොමු කරන විට ඔවුන් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කළත්, එහෙම නැත්නම් වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය නිෂ්පාදනය කළත්, කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කළත්, ඒකටත් දේශීය වශයෙනුත් අලෙවියක් ඇති කිරීමට.

තමුන්නාන්සේලාට ඒකෙන් පේනවා ඇති මේ වැඩපිළිවෙළ එකින් එකට සම්බන්ධ කරලා වියාපු රටාවක් වාගේ මූහු වෙනා හැටි. දරුවන් ගේ දිවා ආහාරය පවා අප දැන් සකස් කරගෙන යන්නේ ඒ දේශීය නිෂ්පාදනවලට ආහාර ද්‍රව්‍යවලට වෙළෙඳපොළක් ඇති වෙන විදියට. අද පාසලට දරුවකු ගේ දිවා ආහාරය ඒ දරුවා ගේනවා නම්, දේශීය ආහාර ද්‍රව්‍යවලින් පිළියෙළ කරගත් ආහාරයක්, පෝෂ්‍යදයක ආහාරයක් නම් ඒ දරුවට රු. 3 ක් ලැබෙනවා. එහෙම ඒ වැඩපිළිවෙළ යෙදුවෙන්, දේශීය වෙළඳපොළට රුකුලක් ලබාදෙන්න, නිෂ්පාදනයට රුකුලක් ලබාදෙන්න. දැන් මේ වැඩපිළිවෙළේ එකිනෙකට සම්බන්ධ ස්වභාවය තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. මේ තමයි ජනසවියේ පදනම.

දැන් පළමු වන වටයේ අත්දැකීම් රාශියක් තිබෙනවා. ඒ අත්දැකීම් අනුව මේ දෙ වන වටය අප වඩාත් ඵලදායක කරගන්නවා. තමුන්නාන්සේලාට ලැබිලා ඇති මේ ''ජනසවිය දෙවෙනි වටය'' කියන පොත.

එම පොතේ 12 වැනි පිටුවේ මේ රූපය මෙසේ දැක්වේ.




ආධාර කිරීමට බලාපොරොත්තු වන දුප්පත් ජනතාව කොහේ හිටියත් පහත සඳහන් සංවිධාන හා ක්‍රියාවලීන් මඟින් ඔවුන් සම්පත් සහ අවස්ථා සමඟ සම්බන්ධ කෙරෙනවා. එතකොට මේ වැඩපිළිවෙළට මේ වටේ විශේෂයෙන් ම, හැම අමාත්‍යාංශයක් ම ඇතුළු වෙන්න ඕනෑ. ජනසවිලාභීන්ට ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ. ඒ අමාත්‍යාංශවල ව්‍යාපෘතිවල. අමාත්‍යාංශ 26 ක් තියෙනවා. පෞද්ගලික අංශය, බැංකු අංශය, රාජ්‍ය නොවන සංවිධාන අංශය, සමුපකාර අංශය. මීට කලින් දුප්පත් ජනතාව යි මේ අංශය යි අතර සම්බන්ධතා තිබුණේ ඉතා සුළු වශයෙන්. දැන් අප මේ ගැන හිතාමතා ම සම්බන්ධතා ගොඩ නඟාගන්නවා. උදාහරණයක් වශයෙන්, අවශ්‍යතා අනුව බැංකු වෙනස් වෙලා තිබෙන හැටි බලන්න.

මෙම විවිධ අංශ අතර මනා අන්තර් සම්බන්ධතාවයක් සහ එකිනෙකට වෙළී සමීප වී වැඩ කිරීම සඳහා මා විශේෂ සංවිධානයක්

ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. අර ඉඩම ලබාදීම පිළිබඳ කාර්ය සාධන බලකායක් පත් කළා වගේ ම මා බලාපොරොත්තු වෙනවා, ජනසවිය ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙළටත්, ජනාධිපති කාර්ය සාධන මණ්ඩලයක් පත් කරන්නට. මේ අනවශ්‍ය බාධා ඔක්කෝම ඉවත් කොට මේ පරමාර්ථය ඉෂ්ට කිරීම සහතික කිරීම පිණිස. ඒක මා නොබෝ දිනකින් පත් කරන්නට බලාපොරොත්තු වෙනවා. මගේ හිතේ තමුන්නාන්සේලා ඒකට එකඟ වෙයි.

## මෙය ජාතික ප්‍රතිපත්තියක්

අද මේ අවස්ථාවට පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු, දිස්ත්‍රික්කවල දිසාපතිවරු, ඒ වගේම උපදිසාපතිවරු නැත්නම් ප්‍රාදේශීය ලේකම්වරු, අමාත්‍යාංශවල ලේකම්වරු, බැංකුවල නියෝජිතයන් ආදී මේ හැම ක්ෂේත්‍රයක ම නිලධාරීන් අද මෙහි එක් රැස් වී සිටිනවා. කරුණා කරලා මේ දර්ශනය හොඳට තේරුම් ගන්න. මේක මෙතෙක් කල් ඇති වුණ දිළිඳුකමට පිළිසරණක් වීමේ නිකම් සල්ලි බෙදන වැඩපිළිවෙළක් වෙයි. ඒට වඩා වෙනස් ස්වරූපයකුයි මේකෙ තියෙන්නේ. ඒක අපි හොඳට තෙරුම් ගන්න ඕනැ. පාරිභෝජනයට අවශ්‍ය සම්පත් දීලා ඒ ජනතාව ශාරීරික වශයෙන් ශක්තිමත් කරමින් ඔවුන් තුළ සැඟවී තිබෙන ශක්තිය ඔවුන් ගේ දියුණුව සඳහා යොමු කරගැනීමට ඔවුන් විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධ කරන්නට ඒ නිෂ්පාදනය මගින් දේශීය නිෂ්පාදනය නංවන්න, දේශීය වශයෙනුත් වෙළඳපොළක් ලබාදෙන්න. මෙන්න මේක තමයි අපේ මේ වැඩපිළිවෙළේ මූලික පදනම. මේක ජාතික ප්‍රතිපත්තියක්. මුළු රට ම වැලඳගන්න ප්‍රතිපත්තියක්. ඒ නිසා පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු, දිස්ත්‍රික්කවල දිසාපතිවරු, ඒ වාගේම උපදිසාපතිවරු නැත්නම් ප්‍රාදේශීය ලේකම්වරු, අමාත්‍යාංශවල ලෙකම්වරු, ඒ වාගේ ම අනෙක් නිලධාරීනුත් මේ ජාතික ප්‍රතිපත්තිය හොඳට අවබෝධ කරගන්නට ඕනැ. ඒකෙ කිසි වෙනසක් ඇති කරන්නට බැ.

යම කෙනකු වෙනසක් ඇති කරන්න කියලා කිව්වොත් ඒක පිළිගන්න එපා. ඒක නෙවෙයි ජාතික ප්‍රතිපත්තිය. මොකද මට ආරංචි යි එක එක තැන්වල එක එක්කෙනා, එක එක්කෙනාට ඕනැ කරන අර්ථකථන දෙනවයි කියලා. එහෙම කළොත් මේ වැඩපිළිවෙළ සාර්ථක කිරීම අමාරු යි.

අප කල්පනා කළේ වාර එකොළහක දී මේ වැඩපිළිවෙළ නිම කරන්න. නමුත් දැන් ක්‍රියාත්මක වන විදියට මට පෙනෙනවා වාර එකොළහක් ඉන්න අවශ්‍ය වෙන්නෙ නැ. ඊට කලින් මේ වැඩපිළිවෙළ සම්පූර්ණවෙන්නට ඉඩකඩ තිබෙනවා.

## ජනතාව අඳුනාගත් දුප්පත්තු

දැන් අපට උවමනා කළා මේ හැත්තෑ ලක්ෂයක් පවුල් දහතර ලක්ෂයක් ආහාර මුද්දරවලින් ජීවත් වන අය ඇත්ත වශයෙන් අඩු ආදයම් ලබන අය ද රුපියල් හත් සියයකට අඩු ආදයම් ලබන අයද කියල සොයාගන්න. දැන් ඔය ආහාර මුද්දර දීම අප ක්‍රියාත්මක කළේ රජයේ නිලධාරීන් මාර්ගයෙන්. අප මේකට ගෙන ආවා වෙන සංකල්පයක්. ජනතාව ලවා මේ ගැන විමසීමක් කරන්න.

ඒ නිසා අපි කුඩා ගම්මාන මට්ටමෙ සහාය කණ්ඩායම් පත් කරගත්තා. සහාය කණ්ඩායම් ඒ පළාත්වලින් ම පත් කරගෙන ඒ ගොල්ලන් ඒ ඒ ජනසවිලාභීන් අතර හඳුනාගැනීමට ක්‍රියා කළා. එතකොට දැනුම් දුන්නා ආහාර මුද්දරවලින් ජීවත් වන උදවිය කරුණාකරලා එන්න කියලා. එතකොට ආහාර මුද්දරලාභීන් ආවා. නමුත් ඇතැම් දෙනා ආවේ නැ. මොකද නාවේ ? ඒගොල්ලන්ට සමාජයට මුහුණ දෙන්න බැ. ඒගොල්ලන්ට හුඟක් වැඩ, ආදයම් තිබෙන අය. මේකටත් ඇතුළු වෙලා තියෙනවා මොකක් හරි ක්‍රමයකින්. ඒ අය අඩු වුණා. රජය අඩු කළා නෙවෙයි. මේ ජනතාව ගෙ සූපරීක්ෂාවට ලක් කළා ම ඉබේ ම ඒගොල්ලන් නතර වුණා. පළමු වටය පටන් ගැනීමට කලින්, ආහාර මුද්දර ලැබුණු පවුල් දෙ ලක්ෂ විසි හතර දහක් හිටියා. දැන් එය එක් ලක්ෂ පනස් හත් දහකට පහළට වැටුණා. 30% ක් අඩු වුණා.

කවරෙක් ද, ඒ 30% අඩුකළේ ? රජය නො වෙයි. නිලධාරීන් නො වෙයි. අර මහජනතාව මේ වැඩපිළිවෙළට සම්බන්ධ කරගත්ත නිසයි, එය වුණේ. ප්‍රදේශයේ ජනතාව ගේ ම නියෝජිතයන් ඒ සහාය කණ්ඩායමෙ හිටියා. එතකොට කොච්චර මුදලක් හොර පාරේ ගිහිල්ලා තියෙනවද කියලා කල්පනා කරලා බලන්න. වැඩසටහනේ ඉලක්ක කරා යැමේ මාර්ග අප විසින් වැඩිදියුණු කරලා, නැවත විස්තර වශයෙන් කරුණු දක්වා තියෙනවා, ඒ පොතේ. මොනවා ද ඒ සංශෝධන ?

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## අපට අත් වෙන ප්‍රයෝජන දෙකක්

මේ විදියට ජනසවිය රටපුරා විහිදුවා යැවීමෙන් ලැබෙන ප්‍රතිලාභ ටිකක් කල්පනා කර බලන්න. ප්‍රධාන වශයෙන් තමුන්නාන්සේලා හැම දෙනාට ම සුරක්ෂිත භාවයක් ඇති වෙනවා. ඒක නේද අප කාටත් ඕනෑ කරන්නේ ? වෙන කාට වත් ලැබෙන ඵල ප්‍රයෝජනයට වැඩිය අපි සියලුදෙනාට දෙසියනේ කියලා. දවල් කාලය දෙරවල් වහන්නේ නැතුව. ගෙදර ඉන්න පුළුවන් භය නැති ව. 'විට' එකක් එහෙම ලැබෙන්නේ නෑ වැඩට යන්න එපා කියලා. රාජකාරියට ගියොත් ගල්කටාස් එකෙන් පාඩම් උගන්වයි කියල කියන්නෙත් නැහැ. නැතිබැරි ජනතාව ගෙ නැතිබැරිකම් අඩු වුණා. යමක් කමක් තියෙන ආදායමක් ලබන, වැටුප් ලබන, ජනතාව කෙරෙහි ඒ ජනතාව ගේ ඊර්ෂ්‍යාවක් නෑ. ක්‍රෝධයක් නෑ. වෛරයක් නෑ.

ඒබ්‍රහම් ලින්කන්තුමා කියපු කතාවක් මා නිතර ම මතක් කරනවා. ''යම් රටකට බැරි නම් ඒ රටේ නැතිබැරි ජනතාව ඇතිහැකි ජනතාව බවට පත්කරන්න, එහෙනම් ඒ රජයට පුළුවන්කමක් නෑ, ඒ සමාජයට පුළුවන් කමක් නෑ, ඒ රටේ යමක්කමක් ඇති අයට ආරක්ෂාව ලබාදෙන්න.'' ඒක මතක තියාගන්න. අත්‍යවශ්‍ය දෙය අපට ඒ ජනතාවට ලබාදෙන්න බැරි නම්, අප කල්පනා කරන්න ඕනෑ, එහෙම නම් අප අපට ම ලොකු අපරාධයක් කරගන්නවා කියලා. අප අපේ ම ආරක්ෂාව නැතිකරගන්නවා කියලා. ඒ නිසයි මා මේ ඉල්ලීම තමුන්නාන්සේලාට කරන්නේ. තමුන්නාන්සේලා විවිධ ක්ෂේත්‍රවල බලධාරීන්, තමුන්නාන්සේලා ගේ සහ යමක්කමක් ඇති මේ රටේ උදවිය ගේ ම ආරක්ෂාව පිණිස අපි මේ වැඩපිළිවෙළ සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ යුතු යි. එහෙම නැතුව මේක රජයේ අණක් උඩ, නියමයක් උඩ, එහෙම නැත්නම් මේක පව් නේද අර මිනිසුන්ට උපකාරයක්, පුණ්‍යකර්මයක් හැටියට කරනවයි හිතන්න එපා. අඩු ගණනේ මෙය අපේ ආරක්ෂාව පිණිස අප කරන්න ඕනෑ කියල දැඩි අධිෂ්ඨානයක් ඇති කරගන්න. එහෙම නුණොත් තමුන්නාන්සේලාට නැවතත් අර පහුගිය කාලේ ඇති වෙච්ච භීෂණයට වඩා දරුණු භීෂණයකට පත් වෙන්න වෙනවා. මේ ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑ.

දෙ වන ප්‍රයෝජනය නම් තමන් ලබන ආදායමෙන් වත් ජීවත් වෙන්නට අමාරුකම් තියෙනවා නම්, ඒකටත් මේ වැඩපිළිවෙළෙන්

ප්‍රයෝජනයක් ලැබෙනවා. මෙ දහතර ලක්ෂයක් පවුල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිෂ්පාදනයට බැස්සා ම එම නිෂ්පාදනය විසින්, ඇති උදවිය ගේ ජීවන බරත් අඩුවෙනව නේ ? යමක් කමක් ඇති අය ලබන දෙ වන ප්‍රතිලාභය ඒක යි.

## සල්ලි ලැබෙන මාර්ග

එතකොට නොයෙක් අය කිව්වා මේ ජනසවිය අප ආරම්භ කරන වෙලාවෙ, මෙ ගැන ප්‍රතිඥා දෙන වෙලාවෙ, මැතිවරණයට කලින් ඔබා කරන්න කොහෙද සල්ලි කියලා. ඉතින් මා ඒ දවස්වල ඒ මැතිවරණ කාලේ කිව්වා සල්ලි මට මවන්න පුළුවන් කියලා. මට පේනවා දැන් සල්ලි මැවිගෙන එනවා. දැනුත් නොයෙක් නොයෙක් අය කියනවා ''සල්ලි නෑ, සල්ලි නෑ'' කියලා. සමහර විට ඒගොල්ලන්ට ඒවා නොපෙනෙන මුදල් වෙන්න පුළුවන්. මේ වැඩපිළිවෙළ දෙස වපර ඇසින් බැලුවා නොයෙක් අය. අපට උදව් ආධාර දෙන ආයතනත් එ සේ කල්පනා කළා. නමුත් මම කියන්න කැමති යි ජනසවිය ක්‍රියාත්මක කිරීමට මුදල්වලින් කිසි ම අඩුවක් පාඩුවක් නැති බව. අඩුපාඩුව තිබෙන්නේ කැප වීමෙන් මේවා ක්‍රියාත්මක කරන්න භාරගන්න උදවිය ගෙ. කැප වීම වැඩි වුණ තරමට මේ වැඩපිළිවෙළ සාර්ථක වෙනවා. මුදල්වලින් කිසි ම අඩුවක් අපට නැති වෙනවා. මේ බව මම ප්‍රකාශ කරන්ට කැමති යි.

දැන් බලන්න අප කිව්වා අර රු. 1042ක් මාස 24ක් එකතු වෙලා, එකතු වෙලා ගිහිල්ලා රු. 25,000ක් ගොනු වුණා ම ප්‍රයෝජනය වෙනවා ඇපයක් හැටියට. ණයක් ගන්න වුණත් අපේ ජනසවිලාභීන්ට ඉදිරි කාර්ය කරන්නට. අද මොකක්ද ඇති වෙලා තියෙන තත්ත්වය. දැන් ම ඉඳලා ම ඇප නැතුව ණය දෙනවා. ඒ මුදල් නෙවෙයි ද ඇප නැතුව ණය වශයෙන් දෙන්නේ ? ඒක ප්‍රතිලාභයක් නෙවෙයි ද ? දැන් ම ඉඳලා ඇප නැතුව ණය දෙනවා. ඒ විතරක් නෙවෙයි ජනසවිය වැඩපිළිවෙළ ප්‍රතිඵලදායක වැඩපිළිවෙළක් හැටියට දිළිඳුකම පිටුදැකීමට මෙ තෙක් ලෝකයේ ආරම්භ වෙච්ච ඉතා ම අර්ථවත් වැඩපිළිවෙළ හැටියට ජාත්‍යන්තර ආයතන පවා පිළිගෙන තියෙනවා. පිළිගෙන තියෙනවා විතරක් නො වෙයි, දැන් උදව් ආධාරත් දෙනවා. ජනසවිය වැඩසටහන ජාත්‍යන්තර වශයෙන් ම පිළිගෙන ඒට මහත් ප්‍රසාදයක් පළ කර තියෙනවා. එය සාර්ථක කරදීමට නොයෙක් සංවිධාන ඉදිරිපත් වී තියෙනවා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

**ජනසවිය භාරය**

**''ජනසවිය භාරකාර අරමුදලට'' අවශ්‍ය මුදල් සැපයීමට ලෝක බැංකුව ඉදිරිපත් වී සිටිනවා. ජනසවිය පිළිබඳ ''ට්‍රස්ට්'' එකක් භාරයක් ඇති කරන්න. බැංකුවක් වගේ අරමුදලකට උදව් ආධාර කරන්නට ලෝක බැංකුව ලෑස්ති යි කියලා තියනවා. එතකොට අපට රුපියල්වලින් ලක්ෂ 40,000ක් නැත්තම් රුපියල් කෝටි 400ක්, නැත්නම් ඩොලර්වලින් ඩොලර් මිලියන සියයක් දෙන්න එකඟවෙලා තියෙනවා. මේ තුන් අවුරුදු කාලයකට යි. නැතිබැරි අය ඇතිහැකි අය බවට පත් කරන්න. ඔවුන්ට රැකීරක්ෂා ලබාදෙන්න. අප ඒ මුදල් ඵලදයී ව වියදම් කළොත්, කාර්යක්ෂම ව නිෂ්පාදනය සඳහා වියදම් කළොත්, අපට පොරොන්දුවෙලා තිබෙනවා තවත් මුදල්වලින් ආධාර දෙන්නට. එතකොට මුදල්වලින් අපට අමාරුවක් නෑ. අඩුවක් නෑ. ඒ විතරක් නෙවෙයි. මේ ජනසවිය වැඩපිළිවෙළේ නිෂ්පාදන ක්ෂේත්‍රයට අපේ මේ ජනතාව හරියට අප යොමුකළොත්, ඔවුන්ට අද අපේ බැංකුවකින් ම ලබාගන්නට තිබෙන ආධාර උපකාර ඵලදයී ලෙස ලබාගෙන ක්‍රියාකරන්නට සැලැස්වූවහොත්, ඒ නිෂ්පාදනය මගින් ම අපට අපේම සම්පත් උපයා ගන්න පුළුවන්වෙනවා නේද ?**

ඒක ලෝක බැංකුවට පෙනිලා තියෙනවා. ඒ පෙනුණු නිසා තමයි මේ ආධාර දෙන්නේ. එහෙම නැතුව පිනට දෙන්න නෙවෙයි. ඒකතමයි මෙකේ ප්‍රතිඵලය. ඒගොල්ලන් ඇවිල්ලා සමීක්ෂණය කළා, පරීක්ෂා කළා. පළමු වන වටය ක්‍රියාත්මක වන හැටි බැලුවා. ඒගොල්ලන්ට පෙනුණා මේ වැඩපිළිවෙළට උදව් කළොත් මේ නැතිබැරි ජනතාව ඇතිහැකි ජනතාව බවට ඉක්මනට පත් කරන්න පුළුවන් කියලා. දැන් මෙකට අප ඇති කරලා තියෙන්නේ බොහො ම සැහැල්ලු පරිපාලන තන්ත්‍රයක්. සුපරීක්ෂ්‍යාකාරීව තෝරාගත් දක්ෂ මණ්ඩලයකින් යුක්ත ව මෙක ක්‍රියාත්මක කරනවා. කළමනාකාර අධ්‍යක්ෂවරයා හැටියට අපි චරිත රත්වත්තේ මහත්මයා පත් කරනවා. ජනසවි භාර අරමුදල පහත සඳහන් අරමුදල් තුනෙන් යුක්ත යි.

1. ණය දීමේ අරමුදල
2. පුහුණු කිරීමේ අරමුදල
3. පොදු වැඩ සඳහා අරමුදල

## ණය දීමේ අරමුදල

දුප්පත් ජනතාවට ඇපකරුවන් ඉදිරිපත් කිරීමක් නොමැති ව ණය පහසුකම් සැපයීම සඳහා පමණක් භාවිතා වන්නක් ලෙසින් ක්‍රියාත්මක වෙනවා. ඒ ණය අරගෙන ප්‍රතිඵලදායක ලෙස යොදවනවා නම් දුගී දුප්පත් ජනතාවට තවත් දුරට ඇප නැති ව ණයගන්න පුළුවන්.

## පුහුණු කිරීමේ අරමුදල

පුහුණු කිරීමේ අරමුදලින් බලාපොරොත්තු වන්නේ පුද්ගලයන්ට මෙන් ම සංවිධානවලටත් ඔවුන් ගේ සංවිධාන හා වැඩසටහන් කාර්යක්ෂම ව සැලසුම් කොට පාලනය කිරීමට ආධාර කිරීම යි.

## පොදු වැඩ සඳහා අරමුදල

දිනපතා කුලියක් ගෙවා, ගමේ දුප්පතුන්ට ඵලදායී වන පොදු පහසුකම් ගොඩනැඟීමේ වැඩ කිරීමට, මෙයින් ඉඩ සැලසෙනවා.

ජනසවිය භාරකාර අරමුදලේ විශේෂ ලක්ෂණයක් වන්නේ එය හවුල්කාර සංවිධාන මගින් ගනුදෙනු කිරීම යි. හවුල්කාර සංවිධාන හැටියට ඕනෑ ම ප්‍රදේශයක ඕනෑ ම සංවිධානයකට ඉදිරිපත් වෙන්න පුළුවන්. ඒවා රජයට අයත් නොවන සංවිධාන, බැංකු, රාජ්‍ය සංවිධාන හෝ ගැමි මට්ටමේ කණ්ඩායම් වෙන්න පුළුවන්.

අප බොහො ම සැලකිල්ලෙන් මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනවා. මේ මේවා කඩා බිඳ දමන්නට, කරන්න එපා කියලා කියන්නට කිසි ම කෙනෙකුට අවකාශ නැහැ. මා ඇතුළු කිසි ම කෙනකුට අවකාශයක් නැහැ. මා එහෙම නමුන්නාන්සේලාට කිව්වොත්, මේ අවස්ථාවේ ඒක ඕන නැහැ, මා කියන එක්කෙනා ගන්න යි කියලා, නමුන්නාන්සේලා මට විරුද්ධ ව පැමිණිලි කරන්න. කිසි ම කෙනකුට අවකාශයක් නැහැ නමුන්නාන්සේලාට බලපෑම් කරන්න. කිසි දේකට බය වෙන්න එපා. මා ඉන්නවා ඒ ආරක්ෂාව දෙන්නට. රජයේ සංස්ථාවල, පාලන අංශවල, පළාත් සභාවල මේක එහෙම බිඳින්න ඉඩ තියන්න එපා. මම විශේෂයෙන්ම කැමති යි ප්‍රධාන ලේකම්වරුන්ට කියන්නට. මේ 'සම්බන්ධ ව :අප ස්ථිර කොමිෂන් සභාවකුත් පත් කරනවා. මේ නිර්දේශ, මේ නීති රීති කඩාබිඳ

දැම්මොත්, එයාට විරුද්ධ ව උසාවියේ නඩු දලා ඔහු හිරේ යවන්නට සිද්ධ වෙන නීති රීති ඇතුළත් කරනවා. එහෙම කරන්නේ වෙනත් බලපෑම්වලින් නිලධාරීන් ආරක්ෂා කරන්නට යි.

ඉන්පසු බලන්න විවිධ දුප්පතුන් කොටස් පහකට අලුතෙන් වර්ග කරලා තියෙන හැටි. ඉතා දුප්පත් නැත්නම් රුපියල් හත් සීයයට අඩු ආදයම් ලබන පළමු වැනි කොටස, කොට්ඨාශ පනස් අටක ජනසවිය පළමු වැනි හා දෙ වැනි වටය ලබනවා. තවත් ඉතා දුප්පත් පවුල් කොටසක් කොට්ඨාශ දෙ සීය විසි එකක වැඩි කළ ආහාර මුද්දර ලබනවා. ඊළඟට එන්නේ තරමක් දුප්පත්, රුපියල් හත් සීයයට වැඩි ඒත් රුපියල් එක් දහස් පන්සීයයට අඩු පවුල්. ඔවුන් කොට්ඨාශ 279 ම ඉන්නවා. හතර වන කොටස පාසලෙන් ඉවත් ව රැකියාවල් සොයන තරුණයෝ. ඔවුන් ද කොට්ඨාශ 279 පුරා ම ඉන්නවා. අවසානයට එන්නේ මහලු, අසරණ, ආදයම් ඉපයීමට ශක්තියක් නැති කොටස යි. ඔවුන් වටිනාකම වැඩිකළ මහජනාධාර ලබාවි.

### ලෝක බැංකුව සහ අපි

දැන් දැක්කා ද අප මේ වැඩපිළිවෙළ අපි මුලින් ම පටන්ගත්තේ රුපියල් හත් සීයයේ පවුල්වලින්. දැන් මේ වැඩපිළිවෙළ තවත් පුළුල් විගෙන යනවා. ඇතැම් උදවිය මෙක නොදැනගෙන යි ඉන්නේ. දැන් ඔන්න ජනසවිය කපාගෙන යනවා. අඩු කරගෙන යනවා. ලෝක බැංකුව නො වෙයි නේ මේ රට පාලනය කරන්නේ. පාලනය කරන්නේ මේ රටේ ජනතාව. මේ ආණ්ඩුව පත්කළේ රටේ ජනතාව. ලෝක බැංකුවෙන් අප ආධාර ලබාගන්න එක ඇත්ත. අපේ උවමනාවට එහෙම ආධාර ලබාගන්න විට අපේ 'ස්වෛරීභාවය' අපි කවරද වත් මොන ලෙසකින් වත් පාවා දෙන්නේ නැහැ. ලෝක බැංකුවට උවමනාවකුත් නැහැ මේ රට පාලනය කරන්න. ලෝක බැංකුව පිහිටුවලා තියෙන්නේ රටවල් ඔක්කෝම එකට එකතු වෙලා, සම්බන්ධ වෙලා. මෙක රටවල් පාලනය කරන බැංකුවක් නෙවෙයි. ඒ ඒ රටවලට මුදල් ආධාර දීලා මුදල් එකතු කරලා නොයෙක් රටවලට ආධාර දෙනවා. අපිත් ඒකේ දායකයෝ. අපිත් සාමාජිකයෝ. අපිත් අධිපතිවරු.

### විමධ්‍යගත කිරීමේ අරමුණ වියදම් අඩු කිරීම යි

දැන් මම කැමති යි විමධ්‍යගත කිරීම ගැන අදහස් දක්වන්න. මේ බලය විමධ්‍යගත කිරීමේ පරමාර්ථය තිබුණේ වඩා තාස්තිය වැඩි කිරීමට

හෝ අකාර්යක්ෂමතාව වැඩි කිරීමට හෝ දූෂණය ව්‍යාප්ත කිරීමට නොවන බව මම ප්‍රකාශ කරන්න කැමති යි. තමුන්නාන්සේලා දන්නවා ඇති රජය සතු ව තිබුණු කාර්යභාරයන් ගණනාවක් ම පළාත්වලට භාරදීලා තියෙනවා. රෝහල් පිළිබඳ ව, පාසල් පිළිබඳ ව, ඒ මට්ටමේ පාරවල් පිළිබඳ ව, විදුලිබලය පිළිබඳ ව, කුඩා පරිමාණයේ වාරිමාර්ග පිළිබඳ ව, ඉඩම් පිළිබඳ ව කාර්යභාරයන් මහත් රාශියක් දීලා තියෙනවා. මගේ හිතේ ප්‍රධාන ලේකම්වරුන් විශේෂයෙන් ම සමීක්ෂණය කරන්න ඕනෑ. මේ තමන් ගේ ආයතනයකට පැවරී තිබෙන රජය සතු ව තිබුණු කාර්යභාරයන් පැවරුණාට මේ අවශ්‍යතා දෙක කොයිතරමට ඉටු වෙලා තියෙනවා ද නැද්ද කියලා. කරුණා කරලා ප්‍රධාන ලේකම්වරු අධ්‍යයනයක් කරන්න. සමීක්ෂණයක් කරන්න මේවා රජය භාරයේ තිබෙන වෙලාවේ කාර්යක්ෂමතාව කොච්චර ද, වියදම කොච්චර ද දැන් පළාත් සභා යටතේ ඒවායේ කාර්යක්ෂමතාව කොච්චර ද වියදම කොච්චර ද කියලා.

### විමධ්‍යගත මුදලුත් වඩාත් ඵලදායී කිරීම

මේ රටේ තියෙන්නේ එක ආණ්ඩුව යි. ඒක අපි මතක තියාගන්න ඕනෑ. එක ආණ්ඩුව යි තියෙන්නේ. අනික් ඒවාට ඒ ඒ නම්දලා තියෙනවා පළාත් සභාව ඒ ඒ පළාතේ වැඩකටයුතු කරන්නේ මහ නගර සභාව, නගර සභාව, ප්‍රාදේශීය සභාව. ඉතින් ඒ බලතල රජය දෙනවා යම් යම් ආයතනවලට. එහෙම දෙන්නේ වඩාත් කාර්යක්ෂම සේවාවක් ජනතාවට ලබාදෙන්න. අනික් එක මධ්‍යගත ව තියෙන වෙලාවේ වැය වුණ මුදලට වඩා වැඩියෙන් ඒ සේවාව ලබාදෙන්න. ඒක තේරෙනවා ද නැද්ද කියලා ඒක සොයා බලන්නට තමුන්නාන්සේලාට අවකාශ තිබෙනවා.

එතකොට මා කියලා තිබෙනවා අපේ මැති ඇමතිවරුන්ට තමන් ගේ දිස්ත්‍රික්කයේ උපදිසාපති කොට්ඨාශයක් පාසා ම ගිහින් ඒ උපදිසාපති කොට්ඨාශයේ ඉන්න ග්‍රාම නිලධාරීන් හමු වෙලා, අවශ්‍යතා අඳුනාගන්න කියලා. එම නිලධාරීන් ග්‍රාමෝදය මණ්ඩලයේ නිලබලයෙන් ම ලේකම්. ඒ ඒ ග්‍රාමසේවා කොට්ඨාශයේ ජනතාව ගේ ජීවන තත්ත්වය නැංවීමට වහා ම උවමනා කරන අවශ්‍යතාව මොකක්ද කියලා හඳුනාගෙන ඒ මැති ඇමතිවරුන් ගේ විමධ්‍යගත මුදල්වලින් ප්‍රමුඛත්වයක් අනුව මුදල් යොදවන්නට ක්‍රියාකරන්න යි

කියලා. කැමති මැති ඇමතිවරුන්ටත් එ සේ කරන්න පුළුවන්. සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කැමති තමන් ගේ විමධ්‍යගත අරමුදල් තමන්ම හඳුනාගත්ත වැඩපිළිවෙළවලට යොදන්න. ඒකෙත් වරදක් නැහැ. දිසාපතිවරුනට ඒකට ඉඩ දෙන්න පුළුවන්.

යම් මන්ත්‍රී කණ්ඩායමක් ඒ දිස්ත්‍රික්කයේ එකට එකතු වෙලා උපදිසාපති කොට්ඨාශ මට්ටමෙන් එකින් එකට ගිහිල්ලා ඒ ඒ ප්‍රදේශවල ජනතාව ගේ කඩිනම් වැඩිදියුණුව පිණිස ඔනෑ කරන ක්‍රියාදමයන් සකස් කරලා, ඒවාට මුදල් වැය කරනවා නම්, එහෙම කරන්නත් පුළුවන්. ඒක තමයි වඩා ඵලදායී ක්‍රමය.

මා විශ්වාස කරනවා මා කිව්වාට වඩා නමුන්නාන්සේලාට අවබෝධවුණා ය කියා. නමුන්නාන්සේලා මෙ ගැන උනන්දුවෙකින් ක්‍රියා කරන නිසා ගැඹුරු අවබෝධයක් ඇති ව, දැඩි කැප විමෙකින් මේ වැඩ පිළිවෙළ සාර්ථක කරන මෙන් ඉල්ලමින් මගේ කථාව මෙයින් සමාප්ත කරමි.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය